# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/ 64— 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

ගා/අත්ෂා/184,
1976. 11. 19 දින දී,
කොළඹ දී ය.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අංක 446 දරණ දියගහ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි වාඩියවත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි, මායිම් වූ අක්කර එකකුත් රූඩ් එක (අක්කර 1, රූඩ් 1) ක් පමණ විශාල වූ බිම් කොටස :—

උතුරට : පිට වගුර ;
නැගෙනහිරට : රදළ ලියද්ද ;
දකුණට : මහ කැල්ල ;
බටහිරට : බත්ආත්තයි කැල්ල.

12-653

---

### 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

කො/හෝකන්දර රත්න විද්‍යාලය—හෝකන්දර

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බදිඋද්දීන් මහමූද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සර්වේ ජනරාල් විසින් සකස් කරන ලද අංක කො. 1560 හා 1973. 08. 16 වෙනි දින දරණ පිඹුරෙහි සඳහන් ඉඩම් කැබලි 1 හා 2 ට පිටස්තරව, පිහිටි අංක 13125 හා 1962. 05. 21 වෙනි දින දරණ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1290 දරණ පැවරුම් නියෝගයෙහි උපලේඛනයේ 1 වන ඡේදයෙහි සඳහන් දේපළ 1962. 06. 15 වෙනි දින සිට ආපසු පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

පාප/2/ඒ-35.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1976. 10. 10 වෙනි දින දී ය.

12-679/1

1 A—24227—4,697 (76/12)

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

**කොළ/කඳන රෝමානු කතෝලික සිංහල බාලිකා පාසැල-කඳන**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බදිඋද්දීන් මහමූද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අංක 12992 හා 1962. 03. 21 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1007 දරණ පැවරුම් නියෝගය පහත උපලේඛනයේ සඳහන් දේපලවලට පමණක් අදාල වනතාක් දුරට 1976 ඔක්තෝබර් මස 01 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

පාප/2/ඒ-117.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1976 ඔක්තෝබර් මස 29 වන දින.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලයේ කඳානෙහි කොළ/කඳාන රෝමානු කතෝලික සිංහල බාලිකා පාසැල් භූමියෙහි පිහිටි

උතුරෙන් : පී. පිලිප් පෙරේරාට අයිති ඉඩමෙන්ද,

නැගෙනහිරින් : අඩි 110 ක් දුරට දිවෙන කම්බි වැටෙන්ද,

පාසැල් ගොඩනැගිල්ලේ බටහිරට ඇති පාසැල් අංශයේ උතුරු බිත්තියේ සිට අඩි 3 ක් උතුරින් පිහිටි කම්බි වැටේ ලක්ෂයකින් පටන්ගෙන බටහිර දෙසට අඩි 6 ක් විහිද එතැන් සිට දකුණු දෙසට හැරී අඩි 20 ක් දුරට විහිද එතැන් සිට නැගෙනහිර දෙසට හැරී අඩි 19 ක් දුරට විහිද, එතැන් සිට දකුණු දෙසට හැරී අඩි 50 ක් දුරට දකුණු මායිම හමුවන තෙක් දිවෙන රේඛාවකින්ද,

දකුණෙන් : මාර්ෂල් පෙරේරාට අයත් ඉඩමෙන්ද

බටහිරින් : දේවස්ථානයේ නැගෙනහිරටම ඇති බිත්තිය හා පාසැලේ බටහිරටම ඇති බිත්තිය අතරින් හරි මැදින් දිවෙන කල්පිත රේඛාවකින්ද මායිම් වූ බිම් කොටස

දේවස්ථාන භූමිය තුළින් පාසැල් භූමියට පිවිසීමේ අයිතිය පාසැල සතුවේ.

12-679/2

---

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

4 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

**කොළ/දළුපොත රෝ. ක. පිරිමි පාසල**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බදිඋද්දීන් මහමූද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 13167 හා 1962 ජූනි 13 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1410 දරණ පැවරුම් නියෝගයෙන් පැවරුණු බිම් ප්‍රමාණයට අමතරව පහත උපලේඛනයේ සඳහන් පවරා ගැනීමට යටත් දේපල 1976 නොවැම්බර් මස 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි රජයට පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

පාප/9/1009.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
1976. 10. 29.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලයේ දළුපොත පිහිටි කොළ/දළුපොත (රෝමානු කතෝලික) සිංහල පිරිමි පාසල 1960 ජූලි මස 21 වෙනි දින පැවැත්වූවාවූත් නඩත්තු කරනු ලැබූවාවූත් ස්ථානය, එනම්—

උතුරෙන් : දේවස්ථානයට දිවෙන මාර්ගයෙන් ද (මෙම මායිම අඩි 65 ක් දික් වූවකි) ;

නැගෙනහිරින් : උතුරු මායිමේ නැගෙනහිර කෙළවරින් පටන් ගෙන කරත්ත පාර දිගේ 117 ක් දකුණට දිවෙන රේඛාවකින් ද ;

දකුණින් : නැගෙනහිර මායිමේ දකුණු කෙළවරේ සිට අඩි 22 ක් බටහිරට දිවෙන රේඛාවකින් ද ;

බටහිරින් : පටු පාරෙන් ද මායිම් වූ බිම් ප්‍රමාණය සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයෙහි 1 වන ඡේදයෙහි වෙසෙසා දක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ල.

12-679/3

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

**කොළ/දළුපොත රෝ. ක. පිරිමි පාසැල**

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බදිඋද්දීන් මහමූද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 13167 හා 1962 ජූනි මස 13 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1410 දරණ පැවරුම් නියෝගයේ උපලේඛනයේ 1 වන ඡෙදයේ සඳහන් දේපලවලින් පහත උපලේඛනයේ සඳහන් දේපලවලට පමණක් අදාළ වනතාක් දුරට 1976 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

පාප/9/1009.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2.
1976 ඔක්තෝබර් මස 29 වෙනි දින,

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලයේ දළුපත පිහිටි කොළ/දළුපොත රෝ. ක. සිංහල පිරිමි පාසැල් භූමියෙහි පිහිටි දේවස්ථානය ඉදිරිපිට ඇති නැගෙනහිර සිට බටහිරට අඩි 79 ක් වූද, උතුරේ සිට දකුණට අඩි 78 ක් වූද, චතුරශ්‍රාකාර වේදිකාව පිහිටි බිම් ප්‍රමාණය.

12-679/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.